ඇත්තටම ඒක දුක හිතුණු කතාවක්..

පසුගිය සන්නස කලාපයේ පළවුණු, ශ්‍රියානි පෙරේරා සොයුරිය විසින් ලියන ලද 'දුක හිතෙන කතාවක්' කියැවූ මගෙ හිතට ඇත්තටම ඒක හුඟාක් දුක හිතුණු කතාවක් වුණා. ඒ අපිත් අපේ දෙමව්පියනුත් අතර තිබුණු ආදරණීය බැඳීම මතක් වීම නිසයි. ලිපියේ සඳහන් සියළු කරුණු වලට සියයට සියයක් ම එකඟවීමේ හැකියාවක් නොතිබුණත් ඒ සිදුවීමට කොහෙත්ම සම්බන්ධයක් නැති කෙනෙකු විදියට ඒ දිහා බලද්දි ශ්‍රියානි සොයුරියට නොපෙණුනු පැත්තකුත් මට පෙණුනා.

ඒ උවිඩ අම්මාගේ කතාව ඔබ දන්නේ ඔබේ මිතුරියගේ පැත්තෙන් පමණයි. නමුත් ඒ අම්මා ජීවත්ව සිටියදී ඔබට ඇය සමග කතා කරන්නට, ඇසුරු කරන්නට අවස්ථාවක් ලැබුණා නම් ඇගේ මෝඩකම, ඇගේ මුරණ්ඩුකම සාධාරණීකරණය කරන්නට ඇති තරම් හේතු ඒ අම්මාට තියෙන්නට ඇති. එය ඒ අම්මාගේ මෝඩකමත්, මුරණ්ඩුකමත් යනුවෙන් හුවා දක්වනවාට වඩා ඒ අම්මාගේ පැත්තෙනුත් කල්පනා කරන්නට ඇයගේ එකුදු දරුවෙකුට හෝ හැකිකමක් තිබුණා නම්... ඒ අම්මාගේ මරණයෙන් අනතුරුව පසුතැවීමට තරම් හේතු ඇයගේ දරුවන්ටත් ඉතිරි නොවන්නට තිබුණා.

මෙහි ජීවත්වන අපි ලංකාවේ යුද්ධය ගැන පසුවන්නේ වඩාත් බියකින්. ලංකාවේ යුදමය වාතාවරණයක් තුළ ජීවත්වන බොහෝ දෙනාට වඩා, මානසික යුද්ධයක් මෙහි වෙසෙන අය ලංකාවේ අය වෙනුවෙන් උසුලනවා. එවැනි

මේනකා ජයතිලක

ක්වීන්ස්ලන්තය

තත්ත්වයක් තුළ ඒ මිතුරිය විතරක් නෙවෙයි; ඕනෑම කෙනෙක් සිතනවා තමන්ගේත්, ඔවුන්ගේත් මානසික සැනසීමට එකම පිළියම තම ආදරණීයයන් තමන් සමීපයට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම කියලා. එහෙම තම දූ දරුවන් සමීපයට එන දෙමව්පියන් ඔවුන් තම ගම් පියසේ නිදහසේ ගතකළ ජීවිතයත් මේ රටේ දරුවන්ගේ ඕනෑ එපාකම් වලට අනුව ගත කරන ජීවිතයත් මනසින් සංසන්දනය කරනවා. සමහර දෙමව්පියන් දරුවන් ගේ ආදරයට මුල් තැන දෙමින් මේ ජීවිතයට හැඩ ගැහෙන අතරම තවත් දෙමව්පියන් දරුවන්ගේ සැඳෙකුම් වල මදිපාඩු දරා ගන්නට බැරි වුණාම මොන දුක දරාගෙන හරි ලංකාවේ ජීවත්වීම සැපතක් විදියට දකිනවා.

මටත් මේ සඳහා මගේ ජීවිතය හා සම්බන්ධ වුණු ලොකු අත්දැකීමක් තියෙනවා. මගේ සොයුරු සොයුරියන් ඕස්ට්‍රේලියාවේ පදිංචිය තෝරා ගත් පසු ලංකාවේ ඉතිරි වුණේ මාත් අම්මාත් විතරයි. රැකියාව සඳහා මම කාර්යාලයට යද්දි විශ්‍රාමික ගුරුවරියක වුණු මගේ අම්මා මෙහෙකරුවන් සමග ගෙදර රැඳුණා. හදිසි අනතුරකින් තාත්තාත්, මල්ලිත් නැති වුණාට පස්සෙ ඇතිවුණු හෘදයාබාධයක් හේතුවෙන් අම්මා දිනපතා බෙහෙත් පාවිච්චි කළා. නිතර දෙවේලේ ඕස්ට්‍රේලියාවේ සිට දුරකථනයෙන් කතාකර අම්මාගේත්, මගේත් දුක සැප විමසන සොයුරු සොයුරියනුත් ඔවුන්ගේ දරුවනුත් දකින්නට අම්මාත්, මමත් හැම අවුරුද්දකම තෙමසක නිවාඩුවකට මෙහි ඇවිත් ගියා. ඒ ආ අවස්ථාවක අම්මා අසනීප වූ නිසා හැමෝගෙම තීරණය වුණේ අම්මාත්, මමත් ඉතා ඉක්මනින් පදිංචිය සඳහා මෙහි ආ යුතු බවයි. නමුත් ඒ තීරණය ඉතා තදින් ප්‍රතික්ෂේප කළ අම්මා, හේතුව ලෙස කිව්වේ අම්මා දරුවන්ට අසීමිත ලෙස ආදරය කළත්, ඇගේ මරණින් පසු ඇස්දෙක අක්ෂිදාන සංගමයටත්, ශරීරය පටක බැංකුවටත් දෙන්නට අම්මා ඒ ආයතනවල ලියාපදිංචි වී ඇති බවයි. ඒ නිසා ඇයගේ මරණය කවද සිදුවුණත් එය ලංකාවේදී සිදුවිය යුතු බව අම්මාගේ ඒකමතික තීරණය වුණා. නමුත්; සහෝදර සහෝදරියන් සියළු දෙනාම මෙහි සිටිද්දී, මාත් අම්මාත් ලංකාවේ තනිවීම නුසුදුසු බවත් ඒ නිසාම නිවහැතිගිල්ලේ ඒ ගැන සිතන්නට ඉඩදීමත් නිසා දරුවන්ගේ ආදරයේ අගය අම්මා කලක් ගතවෙද්දී අවබෝධ කරගත්තා.අවසානයේදී වුණේ ඕස්ට්‍රේලියානු රජයට විශාල මුදලක් ගෙවා අම්මාට මෙහි පුරවැසිභාවය ලබා ගැනීමයි.

ඒත් එතරම් වාසනාවන්ත අම්මා ළඟ අපි අවාසනාවන්ත වූ තරම කොයිතරම්ද? පසුගිය අප්‍රේල් අවැස්සේ රෑ දරුවන්ට තෙරුවන් සරණ පතා හින්දට ගිය අම්මා පසුදා උදේ අවදි වූයේ නැහැ. ඒ අම්මාගේ සමුගැනීම. තව බොහෝ කාලයක් දරු මුණුබුරන්ගේ ආදරය විඳින්නට බලා සිටි අම්මා දරුවන් අතර ගතකළේ අවුරුද්දක පමණ බොහෝ කෙටි කාලයක්. ලංකාවේදී ඇගේ ප්‍රාර්ථනාව වූ ශරීරය වෛද්‍ය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රදානය කිරීම අප මෙහෙදී ඉටු කළා.

අපි දන්නවා, අපි ඇසුරු කරන නොකරන බ්‍රිස්බේන් වල බොහෝ දෙනෙක් දන්නවා, ඒ වගේම විහාරස්ථානවල ස්වාමීන්වහන්සේලා පවා දන්නවා මේ දරු මුණුබුරන්ගේ ආදරය මැද අම්මා කොයිතරම් සතුටෙන් ජීවත් වුණාද කියලා. ඒ ගැන අම්මා කොයිතරම් ආඩම්බරයෙන් කතා කළාද කියලා. නමුත් ඔබ දන්නවද ලංකාවේ අපි ඇසුරු කළ අය සමහරෙකුගේ මතය අම්මා ලංකාවේ හිටියා නම් බොහෝ කාලයක් ජීවත් වෙවී කියනෙකයි. අම්මාගේ මරණයට හේතුව වශයෙන් වෛද්‍ය චාර්තාවේ සඳහන් වුණේ එය ස්වභාවික මරණයක් ලෙසිනුයි. ලංකාවේ සිටියා නම් අම්මා මිය යන්නේ ඊට වඩා වෙනස්ම විදියකින්. හේතුව ලංකාවේ අම්මා සමගින් සිටියේ මං විතරමයි. එහෙම වුවා නම් අවසාන මොහොතේ අම්මාට මං ගැන පසුතැවිල්ලක් ඉතිරි වන්නට ඉඩ තිබුණා.

අම්මා තව කාලයක් අපත් සමග ජීවත් වුණා නම් කියන සිතිවිල්ල හැමදම අපේ හිතේ ඉතිරි වුණත් අම්මාගේ මරණය ගැන ඔබේ මිතුරියට මෙන් පසුතැවීමක් අපට නැහැ. අම්මා ගෙන් බිවූ කිරිවල ණය ගෙවා ඉවර කරන්නට අපට බැරි වුණත් අම්මා වෙනුවෙන් අප උපරිම මට්ටමෙන් යුතුකම් ඉටුකළ නිසාත් අපේ ආදරය අය නොඅඩුව ලැබූ නිසාත් ඒ මානසික සතුට අපි විඳිනවා.

සමහර දෙමව්පියන් ආසාවට රට තොට බලන්න ආවට මෙහි ජීවත් වෙන්නට අකමැතිවා වගේම සමහර දරුවන් දෙමව්පියන් නවතින්නට කැමති වුණත් ඔවුන්ගේ වගකීම් වියහියදම් දරන්නට කැමති වන්නේ නැහැ. ඒ නිසාම ලංකාවේ සිටින්නන්ට ඔවුන් භාරකර මුදලක් අතට යවන්නට පෙළඹෙනවා.

මේ මගේ පැත්තෙන් මම සිතන පිළිගන්න විදිය වුණත් කෙනෙක් මා සමග එකඟ නොවන්නට පිළිවෙනි. හේතුව සෑම මාපිය දූ දරු සබඳතාවය-ක්ම එක වගේ නොවන නිසා. ඔබේ පැතයන්ට අනුව පිළිතුරු බලාපොරොත්තු වන්නේ දස දෙනෙකු ගෙන් නම් ඒ දස දෙනා එකිනෙකාට වෙනස් පිළිතුරු දේවි. හොඳම දෙය නම් මේ ප්‍රශ්න ඔබ ඔබේ මව්පියන් වෙනුවෙන් ආදේශ කර ඒ අසුරින් ඔබේ පිළිතුරු කෙසේද යි සිතීමයි.

ඇත්තෙන්ම වඩාත් සම්පතමයන් මෙහි ගෙන්වා ගැනීමට කටයුතු කිරීම ආත්මාර්ථයක් ලෙස දකින්නට ඔබ පෙළඹුණේ ඇයි? ආත්මාර්ථකාමී සිතිවිල්ලක් දරුවෙකු තුළ ඇති නම් කිසිම ආර්ථික වාසියක් නැති එවැන්නක් වෙනුවෙන් එතරම් මුදල් කන්දරාවක් යට කරයිද? එය දෙමව්පියන්ට රිසි සේ ජීවත්වීමට ඇති අයිතිය උදුරා ගැනීමක් නොව; ඔවුන්ට දරුවන්ගේ ආදරය, සැලකීම ලබාදීම යුතුකමක් සේ සැලකීමයි.

එමෙන්ම තමන්ගේ පරිසරයේ කෙටි කලක් ජීවත් වුණත් හදිසි අනතුරකින් එකවරම ජීවිතය සුනුවිසුනු විය හැකි යයි සහතික විය හැක්කේ කාටද? හදිසි අනතුරු නිසාත්, බෝම්බ සිද්ධීන් නිසාත් විදවමින් ජීවත්වන කීදෙනෙක් ලංකාවේ අදටත් ඉන්නවද? ඒ අනතුරු නිසාම මානසික පීඩාවන් විඳිමින් මානසික රෝගීන් වූ කීදෙනෙක් අපට ලංකාවෙන්ම සොයා ගත හැකිද?

දරුවන්ගේ ආදරයට ලොබ බඳින, දරුවන්ගේ ආදරය මහමෙරක් සේ සලකන බොහෝ දෙමව්පියන් දරුවන් ගේ පුද සත්කාර අනුභව බලාපොරොත්තු වෙනවා මෙන්ම සමහර විට ඒ අම්මාට වෙඩි බෙහෙත් ගඳ හඳුන්කූරු සුවඳක් ලෙස දැණුනේ මොන තරම් සැප සම්පත් තිබුණත් තමන්ට රිසි සේ ජීවත්වීමට තිබූ කැමැත්ත දරුවන්ගේ ආදරයට වඩා බලවත් වූ නිසාවෙන් විය හැකියි.

මගේ සිතිවිලි ඔබේ සිතිවිලි හා සසඳුණත් නොවුණත් අවසාන වශයෙන් මට සඳහන් කරන්නට ඇත්තේද මෙහි සිට දරුවන්ගේ ඕනෑ එපාකම් අනුව ඔවුන්ගේ නිවාස අඩස්සියේ ජීවත්වනවා යැයි ඔබ සිතන දෙමව්පියන්ට වඩා; දරුවන්ගේ ආදරය ඉල්ලා ඔවුන් මෙරටට ගෙන්වා ගන්නැයි හඬන මව්පියවරුන් සිය ගණනක් ලංකාවේ මැරි මැරි ජීවත්වන බව පමණි.

ඕස්ට්‍රේලියාව සඳහා

නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා මාර්තු මස 22 වන බ්‍රහස්පතින්දාද, අභිනව සූර්ය වර්ෂය සඳහා අප්‍රේල් මස 19 වන බ්‍රහස්පතින්දා ද නව සඳ බැලීම මැනවි.

පරණ අවුරුද්ද සඳහා ස්නානයට

අප්‍රේල් මස 12 වන බ්‍රහස්පතින්දා බෝ පත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ඨ දේවතානුස්මරණය කොට වාසය කිරීම මැනවි.

අලුත් අවුරුදු උදාව හෙවත් සූර්ය සංක්‍රාන්තිය

වර්ෂ 2007 ක්වූ අප්‍රේල් මස 14 වන සෙනසුරාදා සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හෝබාර්ට් යන නගරවලට පස්වරු 04.59 ටද, ඇඩිලේඩ් සහ ඩාවින් යන නගරවලට පස්වරු 04.29 ටද, පර්ත් නගරයට පස්වරු 02.59 ටද, සිංහල අළුත් අවුරුදු උදාව හෙවත් සූර්ය සංක්‍රාන්තිය සිදුවේ.

පුණ්‍ය කාලය

වර්ෂ 2007 ක්වූ අප්‍රේල් මස 14 වන සෙනසුරාදා සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හෝබාර්ට් යන නගරවලට පෙරවරු 10.35 සිට රාත්‍රී 11.23 දක්වාද,
ඇඩිලේඩ් සහ ඩාවින් යන නගරවලට පෙරවරු 10.05 සිට රාත්‍රී 10.53 දක්වාද,
පර්ත් නගරයට පෙරවරු 08.35 සිට රාත්‍රී 09.23 දක්වද, පුණ්‍ය කාලය බැවින් සියළු වැඩ අතහැර ආගමික වතාවත්වල නියැලීම මැනවි.

ආහාර පිසීම

සිඩ්නි පස්වරු 05.36 ට දකුණ බලා ද,
කැන්බරා පස්වරු 05.43 ට දකුණ බලා ද,
මෙල්බර්න් පස්වරු 05.58 ට දකුණ බලා ද,
බ්‍රිස්බේන් පස්වරු 05.34 ට දකුණ බලා ද,
හෝබාර්ට් පස්වරු 05.43 ට දකුණ බලා ද,
ඇඩිලේඩ් පස්වරු 05.56 ට දකුණ බලා ද,
ඩාවින් පස්වරු 06.45 ට දකුණ බලා ද,
පර්ත් පස්වරු 05.59 ට දකුණ බලා ද,

වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම සහ ආහාර අනුභවය

අප්‍රේල් මස 14 වන සෙනසුරාදා නිල් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී පහත දක්වා ඇති පරිදි ඒ ඒ ප්‍රාන්ත වල සම්මත ඔරලෝසු වේලාවෙන් දකුණු දිශාව බලා සියළු වැඩ අල්ලා ගණුදෙනු කර ආහාර අනුභවය මැනවි.

සිඩ්නි පස්වරු 07.05 ට දකුණ බලා ද,
කැන්බරා පස්වරු 07.14 ට දකුණ බලා ද,
මෙල්බර්න් පස්වරු 07.28 ට දකුණ බලා ද,
බ්‍රිස්බේන් පස්වරු 07.02 ට දකුණ බලා ද,
හෝබාර්ට් පස්වරු 07.13 ට දකුණ බලා ද,
ඇඩිලේඩ් පස්වරු 07.26 ට දකුණ බලා ද,
ඩාවින් පස්වරු 08.10 ට දකුණ බලා ද,
පර්ත් පස්වරු 07.28 ට දකුණ බලා ද,

හිස තෙල් ගෑම

අප්‍රේල් මස 15 වන ඉරිදා ඒ ඒ ප්‍රාන්ත වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත දක්වව ඇති වේලාවන් හිඳි දකුණු දිශාව බලා හිසට දිවුල් පත්ද, පයට ඉඹුල් පත්ද, තඹා රතු සහ කහ මිශ්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී තෙල් සහ රත්මල් යුෂ මිශ්‍ර නානු ද ගා ස්නානය මැනවි.

සිඩ්නි පෙරවරු 11.35 ට දකුණ බලා ද,
කැන්බරා පෙරවරු 11.44 ට දකුණ බලා ද,
මෙල්බර්න් පස්වරු 12.01 ට දකුණ බලා ද,
බ්‍රිස්බේන් පෙරවරු 11.27 ට දකුණ බලා ද,
හෝබාර්ට් පෙරවරු 11.51 ට දකුණ බලා ද,
ඇඩිලේඩ් පෙරවරු 11.56 ට දකුණ බලා ද,
ඩාවින් පෙරවරු 12.25 ට දකුණ බලා ද,
පර්ත් පෙරවරු 11.56 ට දකුණ බලා ද,

රැකී රක්ෂා සඳහා පිටත්ව යාම

අප්‍රේල් මස 16 වන සඳුදා ඒ ඒ ප්‍රාන්තවල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන් වලට කහ පැවැති වස්ත්‍රාභරණයෙන් සැරසී කිරිබත් අනුභව කොට උතුරු දිශාව බලා රැකී රක්ෂා කටයුතු සඳහා පිටත්ව යාම මැනවි.

සිඩ්නි පෙරවරු 07.05 ට උතුර බලා ද,
කැන්බරා පෙරවරු 07.14 ට උතුර බලා ද,
මෙල්බර්න් පස්වරු 07.34 ට උතුර බලා ද,
බ්‍රිස්බේන් පෙරවරු 06.53 ට උතුර බලා ද,
හෝබාර්ට් පෙරවරු 07.29 ට උතුර බලා ද,
ඇඩිලේඩ් පෙරවරු 07.26 ට උතුර බලා ද,
ඩාවින් පෙරවරු 07.14 ට උතුර බලා ද,
පර්ත් පෙරවරු 07.25 ට උතුර බලා ද,

කරුණ හීන්කෙන්ද

සන්නස

දැන්වීම් සඳහා විමසන්න

03 9402 5380

0425 720 932